# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/06/EP/01/චක්‍රලේඛ - 2026
ඔබේ අංකය / உமது இல / Your No: ........................................
දිනය / திகதி / Date: 2026.01.09

***සමෘද්ධි චක්‍රලේඛ අංක : 2026/02.***

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම දිස්ත්‍රික් විෂයභාර නිලධාරීන්,
සියළුම සමෘද්ධි මූලස්ථාන ,බැංකු සමිති, ව්‍යාපෘති කළමනාකරුවන්,

**<u>සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන - 2026.</u>**

අස්වැසුමලාභී පවුල්වල තරුණ තරුණියන්ගේ හඳුනාගත් කුසලතාවයන් මත ඔවුන් වෘත්තීය පුහුණු අවස්ථා සඳහා යොමුකර වෘත්තීය නිපුණතාවයක් ලබාදී සුදුසු රැකියා සඳහා යොමුකිරීම තුලින් එම පවුල්වල ආදායම් තත්වය ඉහළ නැංවීම 2026 අලෙවි සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

**2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්.**

I. අස්වැසුමලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා වූ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන.
II. අස්වැසුමලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන.
III. අස්වැසුම ප්‍රතිලාභී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කරගත් ධාරිතා සංවර්ධන වැඩසටහන.
IV. රැකියා ඉලක්ක කරගත් රාජ්‍ය සහ පුද්ගලික වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන හඳුනාගැනීමත් එම ආයතන හා පාඨමාලා, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ - (TVEC) නියාමනයට යටත් කිරීම සඳහා දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
V. TVEC අනුමැතිය ලත් පුහුණු ආයතන හා දිස්ත්‍රික්කය තුල රැකියා ගැන්වීමට හැකියාවක් පවතින ආයතන සමඟ ඒකාබද්ධව වැඩසටහන් පැවැත්වීම තුලින්, දිස්ත්‍රික්කයේ ශ්‍රම ඉල්ලුම හඳුනාගැනීම සහ එම ආයතන වල සහයෝගයෙන් වෘත්තිය පුහුණුව ලැබූ තරුණ තරුණියන්ට රැකියා අවස්ථා සලසා දීම.
VI. අස්වැසුමලාභී කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම අරමුණු කරගනිමින් නව සමෘද්ධි සුව බොජුන්හල් ස්ථාපිත කිරීම.
VII. දැනට ස්ථාපිත කරන ලද සමෘද්ධි සුව බොජුන්හල් සංවර්ධනය කිරීමේ වැඩසටහන.
VIII. සමෘද්ධි අභිමානි වෙළඳ ප්‍රදර්ශණය හා අළුත් අවුරුදු පොළ පැවැත්වීම.
IX. සමෘද්ධි ව්‍යාපාරික සංගම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ දිස්ත්‍රික් ව්‍යාපාරික සංගම් පිහිටුවීම.

**02. (i) අස්වැසුමලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා වූ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන.**

අස්වැසුම ප්‍රතිලාභී පවුල් ඉලක්ක කරගනිමින් අ.පො.ස (සා.පෙළ) හෝ අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් පසු පාසල් අධ්‍යාපනය නිමාකල තරුණ තරුණියන්ගේ කුසලතාවයන් නිවැරදි විද්‍යාත්මක ක්‍රමයක් මගින් හඳුනාගනිමින් අධ්‍යාපන හා වෘත්තීය අවස්ථාවන් සඳහා මඟ පෙන්වමින් ඔවුන්ගේ අනාගතය ජයගැනීම සඳහා අවශ්‍ය නිපුණතාවය හා ව්‍යවසායකත්ව අවස්ථා උදාකරදීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. අදාල තරුණ තරුණියන්ගේ තොරතුරු (වසම් මට්ටමින්) සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ (Welfare Benefits Board) වෙබ් අඩවිය බාගත කිරීමෙන් සොයාගත හැක.

මෙම වැඩසටහන සඳහා 20 දෙනෙකු පමණ සහභාගීවීම වඩාත් ප්‍රායෝගික වන අතර මේ සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුක්ත නිපුණතා සංවර්ධන නිලධාරීන්, මානව සම්පත් නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ පුහුණුවලත් තරුණ සේවා නිලධාරීන්,කාර්මික විද්‍යාලවල නිලධාරීන් සහ ගුරු භවතුන් සම්පත් දායකයින් ලෙස යොදා ගත හැක.

එක් වැඩසටහනක් වෙනුවෙන් සම්පත් දායකයින්ගේ සංග්‍රහ, සීමිත සම්පත් දායක දීමනා, ලිපිද්‍රව්‍ය,සවිබලගැන්වීමේ තොරතුරු පද්ධතිය Empowerment Information System (EIS) යාවත්කාලීන කිරීම හා අනෙකුත් වියදම් සඳහා උපරිම රු.5000/= ක මුදලක් වැයකල හැක. මේ වනවිටත් දෙපාර්තමේන්තුව මගින් ඔබ වෙත හඳුන්වා දී ඇති සවිබලගැන්වීමේ තොරතුරු පද්ධතිය Empowerment Information System (EIS) මගින් මෙම වැඩසටහනේ ප්‍රගතිය ලබා දිය යුතුය.

**(ii) අස්වැසුමලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන.**

**1. ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පාඨමාලා (NVQ) .**

අස්වැසුමලාභී පවුල්වල අවු. 16-45 දක්වා වයස් කාණ්ඩයේ සාමාජිකයින් ඉලක්ක කර ඔවුන් රැකියාගත කිරීමේ අරමුණින් මෙම වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කලයුතු වේ.මෙහිදී NVQ- 3 සහ එම මට්ටමින් ඉහළ වෘත්තීමය සහතිකයක් ලබා ගැනීම සඳහා පහත සඳහන් ඕනෑම ක්‍රමවේදයක් භාවිතා කල හැකිය.

I. පූර්ණකාලීන ආයතන ගත පුහුණුව - Center Board Training (CBT)
II. කර්මාන්තගත පුහුණුව - Enterprise Based Training (EBT)
III. පෙර දැනුම පාදක කරගත් ඇගයීම - Recognition Prior Learning (RPL)

- RPL ක්‍රමවේදය යටතේ පමණක් මේ වනවිටත් අත්දැකීම් සහිත වෘත්තීන්හි නිරතවන්නන් වෙනුවෙන් වෘත්තීය කුසලතා සහතික ලබාගැනීම සඳහා කටයුතු කල හැකි අතර,මෙහිදී වයස් සීමාව අවු.60 දක්වා වන ඉලක්කගත පුද්ගලයින්ටද ප්‍රතිලාභ සලසා දිය හැකිය.
- වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) 2026 වර්ෂය සඳහා ලියාපදිංචි වී ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන තෝරා ගත යුතු අතර, අදාල පාඨමාලාවන් ද 2026 වර්ෂය සඳහා ලියාපදිංචි කර තිබීම අනිවාර්ය වේ.
- එමෙන්ම රජයේ ආයතන සමඟ ප්‍රධාන කාර්යාලය ගිවිසුම්ගත වන බැවින්, ගිවිසුම්ගත වීම අවශ්‍ය නොවන අතර පෞද්ගලික අංශයේ පුහුණු ආයතන සමඟ ප්‍රාදේශීය මට්ටමින් ගිවිසුම්ගත වීම අනිවාර්ය වේ.මෙහිදී පුහුණුලාභියා සමඟ ගිවිසුම්ගත වීමද අත්‍යවශ්‍ය වේ.**(ඇමුණුම - 01 හා ඇමුණුම 01-A)**
- මුදල් අයකිරීමකින් තොරව කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) යටතේ ස්ථාපිත තාක්ෂණික විද්‍යාල , කාර්මික විද්‍යාල මගින් පවත්වන NVQ – 03 හා ඊට ඉහළ පාඨමාලා , ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA )මගින් මෙහෙයවනු ලබන NVQ – 03 හෝ ඊට ඉහළ පාඨමාලා හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) මගින් පවත්වනු ලබන කර්මාන්තගත පුහුණුව(EBT)යටතේ NVQ 03 හා ඊට ඉහළ මට්ටමේ පාඨමාලා සාර්ථක ලෙස නිමකරන පුහුණුලාභීන් සඳහා එම ආයතන විසින් නිර්දේශ කරනු ලබන භාණ්ඩ හා උපකරණ කට්ටලයක් (උපරිම රු.50,000.00) ක නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යටත්ව ප්‍රදානය කළ යුතුය.

- වෘත්තීය පුහුණු ආයතන වෙත පාඨමාලා හැදෑරීම සඳහා යොමු කරන පුහුණුලාභීන් අඛණ්ඩව හා සාර්ථක ලෙස පාඨමාලා හැදෑරීමෙන් අනතුරුව රැකියාගත කිරීමේ කාර්යය පිළිබඳ පියවරෙන් පියවර අඛණ්ඩව අධීක්ෂණය කිරීම අනිවාර්ය වේ.
  එක් පුහුණුලාභියෙක් වෙනුවෙන් වැය කල හැකි උපරිම පාඨමාලා ගාස්තුව රු.50,000/= කට සීමාවන අතර ඊට වැඩි පාඨමාලා ගාස්තු රු.100,000 ක උපරිමයකට යටත්ව, දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතියෙන් ලබාදිය හැකිය.

- ඔබ දිස්ත්‍රික්කය තුල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමිත ප්‍රමාණයක් වෙන් කරනු ලබන අතර ,එම මුදල් හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් ලබාදෙන යොවුන් දිරිය ණය 2025.12.23 දිනැති DSD/HO/MF/05/08/01/චක්‍රලේඛ හා සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ අංක - 2021/16 (නව) 08 වන එකතුව මේ සඳහා උපයෝගි කර ගත හැකි වේ.

- අදාල පුහුණු ආයතන සමඟ ගිවිසුම්ගත වීමෙන් පසුව පාඨමාලා ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතුය.

- වෘත්තීය පුහුණු ආයතන වෙත ගෙවීම් කිරීමේදී පසුගිය වසරේදී ගෙවීම් කල ආකාරයටම පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ගෙවීම් සිදුකල යුතුය.
  I. පුහුණුලාභියා විසින් අදාල පුහුණුව සඳහා තම කැමැත්ත මත ආයතනය තෝරාගැනීම (රාජ්‍ය /පෞද්ගලික).
  II. විශේෂයෙන් තෝරාගනු ලබන පෞද්ගලික පුහුණු ආයතනවල වෘත්තීය පුහුණුව සම්බන්ධව කාර්යසාධනය පිළිබඳ විමසා බැලීම.

- ඇතැම් වෘත්තීය පුහුණුව ලබාදෙන රාජ්‍ය ආයතනවල පුහුණු පාඨමාලා 2026 ජනවාරි මස මුල් සතිය තුල හා ඊට ආසන්නයේ ආරම්භව තිබුනද එම ආයතන සමඟ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇති බැවින් මෙම චක්‍රලේඛය නිකුත්කල දිනය ඊට බාධාවක් නොවේ.

2. **<u>සෘජුවම රැකියා ඉලක්ක කරගත් NVQ නොවන සහතික පත්‍ර හා වෙනත් පාඨමාලා සඳහා අනුමැතිය ලබා දීමට සලකා බැලීම.</u>**

- TVEC ආයතනයේ අනුමැතිය ලත් ආයතන හරහා TVEC ආයතනයේ අනුමැතිය ලබාගත් සහතික පත්‍ර පාඨමාලා සඳහා කරනු ලබන ඉල්ලීම්.
- විදේශ සේවා නියුක්ති කාර්යංශයේ 2026 වසර සඳහා අනුමැතිය සහිත ආයතන හරහා විදේශ රැකියාවන් ඉලක්ක කරගත් පාඨමාලා සඳහා විදේශ භාෂා ප්‍රවීණතා සහ වෘත්තීය කුසලතාවය යන පුහුණු කාණ්ඩ දෙකම ඒකාබද්ධ පුහුණුවක් ලෙස සැලකීම.
- එවැනි පාඨමාලා සඳහා අනුමැතිය ලබා දිම සලකා බැලීමට රැකියාගත කිරීමේ නිසි ක්‍රමවේදය සහිතව ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.**(ඇමුණුම - 02)**

**(iii) <u>අස්වැසුම ප්‍රතිලාභී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන</u>**

සමෘද්ධි වැඩසටහන යටතේ හෝ සමෘද්ධි බැංකු ණය වැඩසටහන යටතේ මේ වනවිට ඔබ දිස්ත්‍රික්කයෙන් බිහිවී ඇති අස්වැසුමලාභී පවුල්වල සාර්ථක ව්‍යාවසායකයින් හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන මගින් නව ව්‍යාවසායකත්ව ලක්ෂණ සහිත හඳුනාගත් තරුණ තරුණියන් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කල හැක. මේ යටතේ විශේෂයෙන්ම ව්‍යාවසායකත්ව අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුකල යුතු අතර, අලෙවි ප්‍රවර්ධන විධික්‍රම මගින් ආදායම් වැඩිකර ගැනීම , සමාජ මාධ්‍ය භාවිතය, මාර්ගගත අලෙවිකරණය වැනි බහුවිධ අලෙවි ක්‍රමෝපායන් භාවිතය පිළිබඳව වූ සුවිශේෂී දැනුමක් මේ තුලින් ලබාදීමට කටයුතු කළ යුතුය.
එක් වැඩසටහනක් සඳහා ආහාරපාන, සම්පත් දායක දීමනා හා ලිපිද්‍රව්‍ය යනාදිය වෙනුවෙන් උපරිම රු.60,000.00 ක මුදලක් වැය කල හැක. මෙම වැඩසටහන් සඳහා ප්‍රජා මූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන මගින් සහ සමෘද්ධි සුව බොජුන්හල් වලින් ආහාර සපයාගැනීම කෙරෙහි ප්‍රමුඛතාවයක් දැක්විය යුතුය.

එක් වැඩසටහනක් සඳහා අවම වශයෙන් ව්‍යවසායකයින් 35 දෙනෙකු සම්බන්ධ කර ගත යුතු අතර, වැඩසටහන පැවැත්වීමෙන් පසුව අවම වශයෙන් අඛණ්ඩව මාස 03 ක මාසික පසු විපරම් කටයුතු සඳහා ද මෙම වෙන් කරනු ලබන මුදල් යොදා ගත යුතුය. මෙහිදී ව්‍යාපාරය ලියාපදිංචි කිරීම, ව්‍යාපාරය සම්බන්ධයෙන් ගිණුම් වාර්තා නිසි පරිදි තබා ගැනීම , මාර්ගගත අලෙවිකරණ කටයුතු යනාදී කාර්යයන් සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම කළ යුතු වේ.

පුහුණුව සඳහා මුද්‍රිත හා මුද්‍රිත නොවන ලිපිද්‍රව්‍ය සපයා ගත යුතු වේ. මේ වන විටත් ඔබ දිස්ත්‍රික්කයේ ව්‍යාපාරික සැලැස්ම පිළියෙල කිරීම සඳහා පුහුණුව ලත් පුහුණුකරුවන්, ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරියේ (NEDA) සහ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ (SED) සම්පත් දායකයින් මේ සඳහා යොදා ගත යුතු අතර, පුහුණු වැඩසටහනේදී අනිවාර්යයෙන්ම එම ව්‍යවසායකයින් සඳහා වෙන් වෙන්ව ව්‍යාපාරික සැලැස්මක්ද සකස් කල යුතු වේ. මේ සඳහා සුදුසු පරිදි සම්පූර්ණ දින 02 ක්, හෝ දින ½ වැඩසටහන් 04 ක් හෝ සම්පූර්ණ දින 01 ක් සහ දින ½ වැඩසටහන් 02 ක් ලෙස පහසු පරිදි සංවිධානය කල හැක. මෙම වැඩසටහනේ ප්‍රගතියද EIS මගින් අවශ්‍ය පරිදි ලබාදිය යුතුය.

**(iv)** <u>රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු ආයතන හඳුනාගැනීම සඳහා දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් වැඩසටහන් පැවැත්වීම</u>.

වෘත්තීය පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම සඳහා TVEC ආයතනයේ ලියාපදිංචි ආයතන සීමා සහිත වීම හා අදාල වෘත්තීය පුහුණු පාඨමාලා TVEC යටතේ අනුමැතිය ලබා ගැනීමේදී මතුවන ගැටළු නිරාකරණය කර ගැනීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

එම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ කැඳවීමෙන් දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහනක් සංවිධානය කළ යුතුය. මේ සඳහා දිස්ත්‍රික්කය තුල වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වා ගෙන යනු ලබන ආයතන හා TVEC ආයතනයේ නිලධාරියකුගේ සහභාගීත්වයද අනිවාර්ය වේ. මෙම සැසිය සඳහා උපරිමව රු.25,000/= ක වියදමක් දැරිය හැක. (එක් අයෙකු සඳහා වන වියදම් සීමාව මුල්‍ය බලතල චක්‍රලේඛයට අනුකූල විය යුතුය.)

**(v)** <u>**TVEC** අනුමැතියලත් පුහුණු ආයතන හා දිස්ත්‍රික්කය තුල රැකියා ගැන්වීමට හැකියාවක් පවතින ආයතන හා ඒකාබද්ධව වැඩසටහන් පැවැත්වීම.</u>

දිස්ත්‍රික්කය තුල ඇති TVEC ආයතනයේ අනුමැතිය ලබාගත් පුහුණු ආයතන සහ රැකියා ගැන්වීමට හැකියාවක් පවතින දිස්ත්‍රික්කය තුල පිහිටා ඇති ආයතන ඒකාබද්ධ කරමින් සැසිවාරයක් සංවිධානය කල යුතුවේ. මේ සඳහා දිස්ත්‍රික්කයේ සියළුම අලෙවි විෂයභාර සමෘද්ධි කළමනාකරුවන් , අලෙවි විෂය භාර සංවර්ධන නිලධාරීන් හා මේ සඳහා සුදුසු යැයි හැඟෙන වෙනත් අමාත්‍යාංශ වල දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ද සහභාගි කර ගත යුතුවේ.මෙහිදී දිස්ත්‍රික්කයේ රැකියා වෙළඳපොලෙහි මේ වනවිට පවතින රැකියා අවස්ථාවන් පිළිබඳ තොරතුරු ලබාගැනීමට සුවිශේෂී අවස්ථාවක් හිමිවේ.මේ සඳහා වැය කළ හැකි උපරිම මුදල රු.40,000.00 කි.( එක් අයෙකු සඳහා වන වියදම් සීමාව මුල්‍ය බලතල චක්‍රලේඛයට අනුකූල විය යුතුය.)

**(vi)** <u>**අස්වැසුම්ලාභී කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම අරමුණු කරගනිමින් නව සමෘද්ධි සුව බොජුන්හල් ස්ථාපිත කිරීම.**</u>

2025 වර්ෂයේදී මූලික හඳුනාගැනීම් සිදුකර ඇති සුව බොජුන්හල්, නැවත ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව පිළිබඳව ගැඹුරු අධ්‍යනයක් සිදුකර කඩිනමින් ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම සිදුකල යුතුවේ. මේ හැර යම් දිස්ත්‍රික්කයක සුව බොජුන්හල් ස්ථාපිත කිරීම සඳහා විභවතාවයක් පවතින පරිශ්‍රයක් හෝ ඉඩමක් පවතී නම් ඒ සඳහා අවධානය යොමු කර ප්‍රතිපාදන ඉල්ලුම් කළ හැක.

**(vii)** <u>දැනට ස්ථාපිත කරන ලද සමෘද්ධි සුව බොජුන්හල් සංවර්ධනය කිරීමේ වැඩසටහන</u>.

ඔබ දිස්ත්‍රික්කයේ මේ වනවිට ආරම්භ කර ඇති සමෘද්ධි සුව බොජුන්හල් පිළිබඳව විශේෂ සොයා බැලීමක් කර එහි ඇති අත්‍යවශ්‍ය නවීකරණ කටයුතු සිදුකර වඩාත් පාරිභෝගික ආකර්ශනයක් ඇති කරගැනීම සඳහා පියවර ගත යුතු වේ. එමෙන්ම මෙහි අලෙවි කටයුතු වල නියැලෙන ව්‍යවසායකයින් සංඛ්‍යාව වැඩිකර ගැනීමටත්, ඔවුන් අඛණ්ඩව අලෙවි කටයුතු වල රඳවාගැනීමටත් සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

වසර ගණනාවක සිට මෙම බොජුන්හල් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මෙන්ම විවිධ අරමුදල් වලින්ද මුදල් වැය කර ඇත. එබැවින් මෙම ස්ථාන වල අලෙවි කටයුතු වල නියැලෙන ව්‍යවසායකයින්ගේ ආදායම් මට්ටම අඛණ්ඩව ඉහළ අගයක පවත්වා ගැනීමටත්, පාරිභෝගික ජනතාවට ගුණාත්මකභාවයෙන් යුතු පිරිසිදු ආහාරපාන සහනදායී මිලකට ලබාදීමේ මූලික අරමුණ ඉටු කර ගැනීමටත් සුදුසු පරිසරයක් සකස් කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

අලෙවි කටයුතු සිදුකරන කාන්තාවන් විවිධ අවස්ථාවලදී මින් ඉවත්ව යන බැවින් දැනට සිටින ව්‍යවසායකයින් සඳහා මේ පිළිබඳව පුහුණුවක් ලැබී නොමැති නම් ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මේ සඳහා නිපුණතාවයක් සහිත නිලධාරීන් හෝ දැනටමත් සාර්ථකව පවත්වාගෙන යනු ලබන සමෘද්ධි සුව බොජුන්හල් වල ව්‍යවසායකයින් වෙතින් අදාල න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව ලබාදීමට කටයුතු කළ යුතු වේ. බොජුන්හලේ අලෙවි කටයුතු සිදුකරන ව්‍යවසායකයින් සමඟ වර්ෂ දෙකක් සඳහා ගිවිසුම්ගත වීම අනිවාර්ය වන අතර ඒ සඳහා **(ඇමුණුම - 03)** යොදා ගත යුතුය.

මෙම බොජුන්හල් වල ගුණාත්මකභාවය සහ සෞඛ්‍ය ආරක්ෂිතභාවය සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාවන් ලබා ගැනීම සහ බොජුන්හල් ශ්‍රේණිගත කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සිදුකල යුතුය.

සමෘද්ධි සුවබොජුන් හල් වල අලෙවි කටයුතු ක්‍රියාත්මක කිරීමේදී එහි පරිපාලනය ,මෙහෙයවීම හා අරමුදල් පාලනය පිළිබඳ උපදෙස් **(ඇමුණුම - 04)** මගින් මේ සමඟ ලබාදෙනු ඇත.

සමෘද්ධි සුව බොජුන්හලේ ඉදිරිපස සවිකළ යුතු නාමපුවරුව **(ඇමුණුම - 05)** මගින් මේ සමඟ දක්වා ඇත.

සියළුම බොජුන්හල් වඩාත් හොඳින් හඳුනාගැනීම සඳහා ප්‍රදර්ශනාත්මක පුවරුවක් බොජුන්හලට මීටර් 200 ක් පමණ දුරින් දෙපසින්ම ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතු අතර, ඒ සඳහා වන ආදර්ශනයක් මේ සමඟ ඇත. **(ඇමුණුම - 06)**

**(viii) <u>සමෘද්ධි අභිමානි වෙළඳ ප්‍රදර්ශණය හා අළුත් අවුරුදු පොළ පැවැත්වීම.</u>**

සමෘද්ධි බැංකු/සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති මට්ටමින් මෙම වෙළඳ ප්‍රදර්ශනය සංවිධානය කිරීම වඩාත් යෝග්‍ය වන අතර , මේ සඳහා ව්‍යාපාරික සංගම්හි දායකත්වය ලබා ගැනීම තුලින් සාර්ථක වෙළඳ ප්‍රදර්ශනයක් සංවිධානය කර ගත හැකිය. එසේම මෙවැනි වෙළඳ ප්‍රදර්ශන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වෙනත් රාජ්‍ය ආයතන මගින් සිදුකරන්නේ නම් ඔවුන් සමඟ ඒකාබද්ධවීමෙන් වඩාත් සාර්ථක වැඩසටහනක් සංවිධානය කිරීම පහසු වනු ඇත.

සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදනයන් සඳහා වෙළඳපොල අවස්ථා පුළුල් කරගැනීමට මෙය මහඟු අවස්ථාවක් වන බැවින් , උත්සව සමයන් මුල් කරගෙන තම නිෂ්පාදන ධාරිතාව ඉහල නංවා ගැනීමට ඔවුන් උනන්දු කරවීම අවශ්‍ය වනු ඇත. බැංකු සමිති වල පවතින පොළ අරමුදල් , ව්‍යාපාරික සංගම් අරමුදල්, ප්‍රාදේශීය සංවිධාන වල අරමුදල් මේ සඳහා භාවිතා කල හැකි වේ. නමුත් එම ලබාගන්නා මුදල් නැවත ප්‍රතිපූර්ණය කිරීමට වගබලා ගත යුතු වේ. තවද ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන් , රාජ්‍ය නොවන සංවිධාන වල අනුග්‍රහයද මේ සඳහා ලබාගැනීමට හැකියාව පවතී.

මීට අමතරව නිෂ්පාදකයින්ගේ ගුණාත්මක නිෂ්පාදන සඳහා අලෙවි අවස්ථා පුළුල් කිරීම අරමුණු කරගෙන මහ නගර සභා, නගර සභා , ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ වල පිහිටි සතිපොළ මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් සතියකට දින එකක් හෝ දෙකක් අලෙවි අවස්ථාවන් සඳහා අවසර ලබාගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම සුදුසුවේ.

**<u>(ix) සමෘද්ධි ව්‍යාපාරික සංගම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ දිස්ත්‍රික් ව්‍යාපාරික සංගම් පිහිටුවීම.</u>**

අලෙවි අංශයේ හෝ ප්‍රජා මූල අංශයේ උපදෙස් මත ප්‍රාදේශීය මට්ටමින් ආරම්භ කර ඇති ව්‍යාපාරික සංගම් වලින් මේ වනවිට අක්‍රිය තත්වයේ පවතින ප්‍රාදේශීය ව්‍යාපාරික සංගම් හෝ කණ්ඩායම් ඇත්නම් එසේ අක්‍රිය වීමට බලපෑ හේතූන් සොයාබලා දුර්වල මට්ටමේ පවතින ව්‍යාපාරික සංගම් ඒකාබද්ධ කර පවත්වාගෙන යෑමට උපදෙස් ලබාදිය යුතුය. එමෙන්ම අවශ්‍යතාව පරිදි ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය (NEDA), කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය සහ වෙනත් රාජ්‍ය ආයතන අනුබද්ධිතව පිහිටුවා ඇති ව්‍යාපාරික සංගම් සමඟ ඒකාබද්ධවීම මගින් ද වඩාත් ශක්තිමත් ව්‍යවසායකත්ව ජාලයක් නිර්මාණය කිරීමේ අවස්ථාව හිමිවේ.

එමෙන්ම 2026 වසරේදී දිස්ත්‍රික් ව්‍යාපාරික සංගම් පිහිටුවීම සඳහා කටයුතු කරන මෙන් දන්වන අතර ඒ සඳහා වන දිස්ත්‍රික් සමෘද්ධි ව්‍යාපාරික සංගමයේ ව්‍යවස්ථාව මේ සමඟ ඔබ වෙත එවමි.**(ඇමුණුම -07)**

**03.** **<u>පොදු උපදෙස්.</u>**

I. අලෙවි සංවර්ධන අංශයට අදාලව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී තෝරාගනු ලබන සියළුම පුහුණුලාභීන් / ව්‍යාපෘතිලාභීන් අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුල් ඒකක වල අය විය යුතුය.

II. තෝරාගනු ලබන පුහුණුලාභීන් සහ ව්‍යාපෘතිලාභීන් සියළුම දෙනා සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන සාමාජිකත්වය ලැබූ පවුල් ඒකකවල අය විය යුතුයි.

III. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල , දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල රේඛීය අමාත්‍යාංශවලට අයත් නිලධාරීන්ගේ සහය ලබාගැනීම අනිවාර්ය වේ.

IV. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය, මුදල් රෙගුලාසි හා මෙම චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් කටයුතු කල යුතු වේ.( අස්වැසුමලාභී තරුණ තරුණියන් සඳහා රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මෙය අදාල නොවේ.)

V. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වැය කරන ලද මුදලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 1% ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා 0.5% ක් සහ ප්‍රධාන කාර්යාලය සඳහා 0.5% ක් වන ආකාරයට පරිපාලන වියදම් වෙන් කර ඇති බැවින් , එම මුදල් පරිපාලන වියදම් ලෙසට ලබාගත හැකි වේ. වෙන් කර තිබෙන පරිපාලන මුදලින් 50% ක් දිස්ත්‍රික් ප්‍රතිපාදන සමඟ ලබා දීමට නියමිතය.මෙම චක්‍රලේඛයට අනුව දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිපාදන නිදහස් කිරීමේ ලිපිය ඉතා කඩිනමින් නිකුත් කරනු ඇත.

VI. වෘත්තීය පුහුණු වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා 2025 වසරේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත කොටසක් පමණක් ගෙවීම් සිදුකළ අවස්ථා සඳහා ඉතිරි මුදල 2026 වසරේ වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් ගෙවීම් සිදුකළ හැක.

VII. ලබාදෙනු ලබන භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අග්‍රිම, 2026.11.30 දිනට පෙර ව්‍යාපෘති සහ අනෙකුත් වැඩසටහන් සඳහා වැයකර අවසන් කල යුතුවේ.

VIII. අවශ්‍ය අවස්ථාවලදී ආයතන , පුහුණුලාභීන් සහ ව්‍යාපෘතිලාභීන් සමඟ හඳුන්වා දී ඇති ගිවිසුම් ප්‍රකාරව ගිවිසුම්ගත වීමට කටයුතු කල යුතුය.

IX. වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී, සංවර්ධන නිලධාරී (Development Officer), ව්‍යාපෘති කළමනාකරු, ප්‍රජා මූල බැංකු කළමනාකරු හා ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු එකතුවී කොට්ඨාශයේ ආරම්භ කරන ලද වැඩසටහන් සාර්ථකව නියමිත අරමුණු කරා ළඟා වීම පිළිබඳව සාකච්ඡා කිරීම, ගැටළු විසඳීම සඳහා අවශ්‍ය පියවර හා සම්බන්ධිකරණ කටයුතු , පසුවිපරම හා ප්‍රගතිය වාර්තා කිරීම කල යුතුය.

X. සමෘද්ධි සුව බොජුන්හල් අරමුදල ,සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන අරමුදල ,සමෘද්ධි ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ව්‍යාපාරික සංගම් අරමුදල් යනාදිය අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහ රජයේ විගණන නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක්කල හැකි අතර, ඒ සඳහා අවශ්‍ය පරිදි සියළු ගනුදෙනු සහ ලිපිලේඛන පවත්වා ගත යුතු වේ.

XI. මෙහිදී ප්‍රජා මූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන නිලධාරීන් ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සක්‍රීය අයුරින් සහභාගී කරගත යුතු අතර, විනිවිදභාවය හා සමාජ විගණනයක් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කල යුතු වේ.

XII. පුහුණු වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා පුද්ගලයින් තෝරාගත් අවස්ථාවේදී පටන්ම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු විසින් හඳුන්වාදෙනු ලබන සවිබලගැන්වීමේ තොරතුරු පද්ධතියට Empowerment Information System (EIS) දත්ත ඇතුලත් කල යුතුය.අදාල ගෙවීම් කිරීමට පෙර එම මූලික තොරතුරු EIS වෙත ඇතුලත් කිරීමෙන් පසු පමණක් මුදල් ගෙවීම් සිදුකල යුතුය.

XIII. එමෙන්ම පුහුණුලාභීයා /ව්‍යාපෘතිලාභියා සම්බන්ධයෙන් තෝරාගැනීමේ අවස්ථාවේ සිට සිදුකරනු ලබන සියළුම ක්‍රියාකාරකම් නිරන්තරයෙන් යාවත්කාලීන කල යුතු වේ.

XIV. සවිබලගැන්වීමේ තොරතුරු පද්ධතියට Empowerment Information System (EIS) දත්ත ඇතුලත් කිරීම පිළිබඳව මේ වනවිට A+ නිලධාරීන් දැනුවත් කර ඇති අතර , එම නිලධාරීන් මගින් ඔබ දිස්ත්‍රික්කයේ අදාල නිලධාරීන් දැනුවත් කිරීමේ කටයුතු කඩිනමින් සිදුකරනු ඇත.

XV. (EIS) දත්ත ඇතුලත් කිරීමට අමතරව මේ සමඟ ලබාදෙන **(ඇමුණුම - 08)** ට අදාලව මාසික ප්‍රගතිය එළඹෙන මස 05 වන දිනට පෙර ලබා දීමට කටයුතු කල යුතුය.

XVI. සියළුම වැඩසටහන් සාර්ථක කරගැනීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් සහ සියළුම විෂය භාර නිලධාරීන්ගේ නිරන්තර අවධානය හා පසුවිපරම් කිරීම අත්‍යාවශ්‍ය වනු ඇත.

ඉහත සියළු වැඩසටහන් සාර්ථක කරගැනීමට ඔබ ඇතුළු සියළු නිලධාරීන්ගේ කැපවීම අගය කොට සලකන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර දුරකථන අංක 011-2187547 මගින් හෝ samurdhimarketing@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය මගින් අලෙවි අංශය වෙතින් ලබා ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

සි.ඩි.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-
01. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් - කා.දැ.ගැ.පි.
02. ලේකම්,ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
03.සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කා.දැ.ගැ.පි.
04. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
05. ප්‍රධාන මුල්‍ය නිලධාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.හා අ.ක.ස.
06. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.හා අ.ක.ස.
07. ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගේ හා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්වරුන් - -කා.දැ.ගැ.පි.
08.සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
09.සියළුම සමෘද්ධි ප්‍රජා මූල බැංකු කළමනාකරුවන්, - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
10.සියළුම සංවර්ධන නිලධාරින්, - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
11.සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරින්. - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.